# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2448/21 – 2025 අගෝස්තු මස 05 වැනි අඟහරුවාදා – 2025.08.05**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2023/229.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

ඩබ්. චිත්‍රා වීරක්කොඩි මිය, අංක 21, දියවැල, කිරිදිවැල.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන ) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම්කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් කළුතර, නාගොඩ, ශ්‍රී සෝභිත මාවත, නො. 242, නීතිඥ ඔබඩගේ ලීලාරත්න මයා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය.

2025 ජුලි මස 31 වන දින,
කොළඹ දී.

මගේ අංකය: IR/COM/01/2023/229.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ඩබ්. චිත්‍රා වීරක්කොඩි මිය, අංක 21, දියවැල, කිරිදිවැල.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

"2015.03.15 දින සිට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ගම්පහ ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රාදේශීය මුදල් කළමනාකාර (ආවරණ) තනතුරේ සේවය කළ ඩබ්.චිත්‍රා වීරක්කොඩි යන අයට 2020.02.27 දින සිට නිල වාහනය අහිමි කිරීම හේතුවෙන් යම් අසාධාරණයක් සිදුවී තිබේද? යන්නත් එසේ නම් ඇයට හිමිවිය යුතු සහනයන් කවරේ ද යන්නත් පිළිබඳව වේ."

**එච්.එම්.ඩී.එන්.කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 ජූලි මස 09 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 08 – 0058

---

මගේ අංකය: IR/COM/02/2020/54.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

එච්.ජී.රත්නායක මයා, නො.115/ජී/5, උස්සද්දෙනිය, බටතොට, කුරුවිට.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, කිරුළ පාර, නාරාහේන්පිට, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් පන්නිපිටිය, කළල්ගොඩ පාර,ජෝන් කීල්ස් නිවාස සංකීර්ණය, නො. 15, කැප්ටන් එම්.ජී.ජී.මෙන්ඩිස් මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය.

2025 ජූලි මස 31 වන දින,
කොළඹ දී.

මගේ අංකය: IR/COM/02/2020/54.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එච්.ජී.රත්නායක මයා, නො.115/ජී/5, උස්සද්දෙනිය, බටතොට, කුරුවිට.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, කිරුළ පාර, නාරාහේන්පිට, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

"ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් රත්නපුර ඩිපෝවේ සේවය කරමින් සිටි එච්.ජී.රත්නායක මයා 2015.09.29 දින සිට සේවයෙන් පහ කිරීම මගින් ඔහුට අසාධාරණයක් සිදු වී තිබේ ද? එසේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේ ද යන්නත් පිළිබඳව වේ."

**එච්.එම්.ඩී.එන්.කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 ජුලි මස 28 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 08 – 0059